# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2369/06 - 2024 ජනවාරි මස 29 වැනි සඳුදා - 2024.01.29**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන (ලියාපදිංචි කිරීමේ) පනත යටතේ බලයලත් නිලධාරීන් පත්කිරීම**

2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන (ලියාපදිංචි කිරීමේ) පනතෙහි උපවගන්ති 14.4 යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව, සෞඛ්‍ය අමාත්‍ය වෛද්‍ය රමේෂ් පතිරණ වන මා විසින් පහත උපලේඛනයෙහි පවරා ඇති ප්‍රදේශ සහ සේවා අවශ්‍යතාවය මත වැඩ බැලීමට පත් කරනු ලබන වෙනත් ඕනෑම ප්‍රදේශයක් සම්බන්ධයෙන් එකී පනතේ අරමුණ සඳහා මෙහි උපලේඛනයෙහි දැක්වෙන පහත සඳහන් නිලධාරීන් බලයලත් නිලධාරීන් ලෙස පත් කරමි. ඔවුන් නිලබලයෙන් පත් කරනු ලබන අතර මෙහි උපලේඛනයන්හි සඳහන් එකී තනතුර දරන දැනට සිටින නිලධාරීන් මෙන්ම එකී තනතුර තත්කාලයෙහි පත් කරනු ලබන නිලධාරීන් ද මෙයින් ආවරණය වේ. මෙම සියළු පත්වීම අදාළ නිලධාරීන් සේවයේ නිරත වනතාක් කල් වලංගු වේ.

අංක 2011/33 දරන 2017.03.24 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් දැනටමත් සිදු කර ඇති එවැනි පත්වීම් ඒ ආකාරයෙන්ම බලාත්මකව පවතී.

වෛද්‍ය **රමේෂ් පතිරණ**,
සෞඛ්‍ය අමාත්‍ය.

2023 දෙසැම්බර් මස 20 වැනි දින,
කොළඹ දී ය.

උපලේඛනය

1. පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන් - පවරන ලද පළාත්
2. පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා විසින් නම් කරන ලද පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අනුයුක්තව වෛද්‍යවරයකුගේ නිලයට පහළ නිලයක නොවන නිලධාරියකු
3. ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන් - පවරන ලද ප්‍රදේශය / ප්‍රදේශ
4. ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා විසින් නම් කරන ලද ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අනුයුක්තව වෛද්‍යවරයකුගේ නිලයට පහළ නිලයක නොවන නිලධාරියකු
5. නියෝජ්‍ය පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන් - පවරන ලද ප්‍රදේශය / ප්‍රදේශ
6. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරුන් - අදාළ ප්‍රදේශ සහ වැඩ ආවරණ කාලය තුළ ඊට අදාළ ප්‍රදේශවල
7. ලේකම් - පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාව - මුළු දිවයින

■ අයිතම 2 සහ 4 යටතේ වන නිලධාරීන් සඳහා වෙනම පත්වීම් ලිපි නිකුත් කරනු ලැබේ.

EOG 01 - 0219


1A - PG 6631 — 154 (2024/01)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*